**<u>සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටුව මගින් නිර්දේශිත නාම යෝජනාව සඳහා විරෝධතා ඇත්නම් ඉදිරිපත් කිරීම - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 48 වැනි උපාධි ප්‍රදානෝත්සවය</u>**

2022.09.22 වැනි දින පැවති සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටු රැස්වීමේදී පීඨ විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා සම්බන්ධයෙන් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 908 සහ සම්මාන උපාධි පිරිනැමීමේ නිර්ණායක අනුව ඇගයීමට ලක්කළ අතර, 2022 ඔක්තෝබර් මස කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිත 48 වැනි උපාධි ප්‍රදානෝත්සවයේදී පහත සඳහන් සම්මාන උපාධිය පිරිනැමීමට සුදුසු බව නිර්දේශ විය.

| පීඨය | යෝජිත නම | යෝජිත සම්මාන උපාධිය |
|---|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | කැලුම් නලින්ද මනමේන්ද්‍ර ආරච්චි මහතා | දර්ශනසූරි (සම්මාන) උපාධිය Ph.D. |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම්මාන උපාධි පිරිනැමීම සඳහා වූ සනාතන සභා නිර්ණායකයන්හී පහත දැක්වෙන 3.5.(1) ඡේදය පරිදි සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටුවේ නිර්දේශ සනාතන සභාවට දැනුම් දීමට පෙර විරෝධතා දැක්විය හැකිය.

**"සම්මාන උපාධි කමිටුවේ නිර්දේශ සනාතන සභාවට දැනුම්දීමට පෙර සති දෙකක (02) කාල පරිච්ඡේදයක් යම් බාහිර පාර්ශවයකට හෝ ආයතනික සාමාජකයින්ට විරෝධතා දැක්වීම සඳහා ලබාදිය යුතුය. දක්වනු ලබන විරෝධතා සංක්ෂිප්තව සහ ලිඛිතව සම්මාන උපාධි කමිටුවේ ලේකම්වරයා වෙත යොමුකළ යුතුය. නිර්නාමිකව ලැබෙන විරෝධතා සලකා බලනු නොලැබේ."**

ඒ අනුව එකී සම්මාන උපාධිය පිරිනැමීම සම්බන්ධව යම් විරෝධතාවක් වේ නම් එය සංක්ෂිප්තව හා ලිඛිතව 2022 ඔක්තෝබර් මස 07 දින හෝ ඊට පෙර ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරී / අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී (කමිටුවේ ලේකම්)
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ
2022.09.23